Department of Education, Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

02 වන වාරය, මැයි 03 වන සතිය

විෂය - නාට්‍ය හා රංග කලාව

සැකසුම -එස්.එස්.සී.ජයසූරිය

9 ශ්‍රේණිය

# සති පාසල කාර්‍ය පත්‍රිකාව

**1.නිපුණතාව 2.0 :** ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොට ගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම 2.6 :** අනුෂාංගික අංග සුසංයෝග කරයි.

**පාඩම -** ආනුෂංගික අංග සුසංයෝග කර පෙළට පණ පොවමු

## 2.ශිෂ්‍යයා විසින් කල යුතු කාර්යයන්:

- අනුෂාංගික අංග හඳුනා ගැනීම.
- ලෝකධර්මී සහ නාට්‍යධර්මී නාට්‍ය වල අනුෂාංගික අංග සුසංයෝග කර ඇති ආකාරය හඳුනා ගැනීම.

- පහත දී ඇති ඉගෙනුම් පත්‍රිකා හා අනෙකුත් ඉගෙනුම් ආධාරක ඇසුරෙන් දි ඇති ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන්න.

- අනුෂාංගික අංග සුසංයෝග කිරීමේදී අවධානය යොමු කල යුතු කරුණු සම්බන්ධයෙන් වැඩි දුරටත් තොරතුරු එක් රැස් කරන්න.

- පාසල ආරම්භයේදී ඔබගේ අනාවරණයන් පන්තිය ඉදිරියේ ඉදිරිපත් කරන්න.

**3.ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි පොත්පත, කියවීම් පත්‍රිකා, Websites සහ ඉගෙනුම් ආධාරක :-**

- **eතක්සලාව -**
  https://www.e-thaksalawa.moe.gov.lk/web/en/

- **eනැණපියස -**
  course : 09 ශ්‍රේණිය නාට්‍ය හා රංගකලාව
  https://enenapiyasa.lk/

- **You Tube –**

  මනමේ නාට්‍ය

  https://youtu.be/wJ2Mi09hGuI

හුණුවටයේකතාව
https://youtu.be/sioOmf886bk

- **කියවීම් පත්‍රිකාව -**

සුසංයෝජනය යනු වඩාත් සුදුසු ආකාරයට එකතු කිරීම යන්නයි. නාට්‍ය කලාව තුළ ද ඇත්තේ සුසංයෝගයකි. නාට්‍යයක් අති සාර්ථක වීමට ආනුෂංගික කලා මනාව සුසංයෝග විය යුතු ය. නාට්‍ය පෙළක් ප්‍රේක්ෂකයා වෙත ගෙන යාම දක්වා ක්‍රියාවලිය තුළ වගකීම් විශාල ප්‍රමාණයක් තිබේ.

- වේදිකා නාට්‍ය සඳහා ආනුෂංගික අංග සුසංයෝග කිරීමේ පියවර ලෙස,
  - නාට්‍ය පිටපත කණ්ඩායමක් සමඟ සාකච්ඡා කරන්න. පිටපතෙහි තේමාව වෙත අවධානය යොමු කරන්න.
  - නාට්‍යයට අවශ්‍ය නළු නිළියන් තෝරා ගන්න. මෙය නළු වර්ණය නමින් හැඳින්වේ. චරිතවලට ගැලපෙන සිසුන් තොරා ගන්න.
  - නාට්‍යයට පසුතල නිර්මාණ අවශ්‍ය වේ නම් ඒවා නිර්මාණය කර ගත යුතු ය. පසුතල නිර්මාණයේ දී භාවිතයට පහසු අමුද්‍රව්‍ය සපයා ගත යුතු ය. නාට්‍ය පුරුදු පුහුණුවීම්වල දී රංග භාණ්ඩ ද භාවිත කළ යුතු ය.
  - නාට්‍ය පුරුදු පුහුණු වී සතියකට පමණ පසුව සංගීතය, නර්තනය අවශ්‍යය වේ නම් යොදා ගත යුතු ය.
  - නාට්‍ය යම්තාක් දුරකට පුරුදු පුහුණු වී අවසන් වූ විට නළු නිළියන්ට අවශ්‍ය රංග වස්ත්‍ර පිළිබඳ ව සැලසුම් කළ යුතු ය. රංග වස්ත්‍ර නිර්මාණ කළ යුතු ය. වේෂ භූෂණ නිර්මාණයේ දී වර්ණ පිළිබඳ ව හා රංගනයට යොග්‍ය රංග වස්ත්‍ර නිර්මාණය කළ යුතු ය.
  - නළු නිළියන්ට අවශ්‍ය වන අංග රචනයන් යොදා ගැනීම සඳහා අංග රචනා ශිල්පියෙකු අවශ්‍ය වේ. මුලින් ම අංග රචනා ශිල්පියාට පෙර පුහුණුවීම් නැරඹීමට අවස්ථාව දිය යුතු ය. මෙහි දී නාට්‍යටයේ ශෛලිය, චරිතවල ස්වභාවය, වටහාගෙන නිර්මාණය කළ යුතු ය.
  - රචකයා විසින් සකස් කරන ලද පිටපත, නළු නිළි සහභාගීත්වයෙන්, වේශ නිරූපණ ශිල්පීන්, පසුතල නිර්මාණ ශිල්පීන්, රංග වස්ත්‍ර නිර්මාණකරුවන්, සංගීත, නර්තන ශිල්පීන් හැඩ ගන්වා තිබුණ ද එය ප්‍රේක්ෂකයා දකින්නේ රංගාලෝකය මඟිනි.

ඉහත ආනුෂංගික අංග මනාව ගැළපුණු සාර්ථක නාට්‍යයක් බිහි වේ.

**නාට්‍යෝපකරණ**

නළු නිළියන් රංගනයේදී දී භාවිත කරනු ලබන උපකරණ  නාට්‍යෝපකරණ ලෙස හැඳින්වේ.

සැබෑ ජීවිතයේ දී භාවිත කරන උපකරණ හා වේදිකා නාට්‍ය සඳහා භාවිත කරන උපකරණ අතර විශාල වෙනස්කම් දක්නට ලැබේ.

නාට්‍යයක් සඳහා නිර්මාණය කරනු ලබන නාට්‍ය උපකරණ වේ නම් ඒවා නාට්‍ය හා අත්‍යන්තයෙන් ම සම්බන්ධ ඒවා විය යුතුය. එනම් නාට්‍ය විකාශනයේ දී  කවර අවස්ථාවක හෝ එම උපකරණ කවර හෝ අවශ්‍යතාවයක් සඳහා භාවිත වියයුතුය.

නමුත් නාට්‍ය උපකරණ භාවිත නොකරමින් අභිරූපන හෝ වෙනත් උපත් උපක්‍රම මගින් මේවා ප්‍රේක්ෂක මනසෙහි මවමින් රූපණය සිදු කරන අවස්ථා ද දක්නට ඇත.

නාට්‍ය උපකරණ නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු ලෙස,

- සැහැල්ලු බව
- සරල බව
- නළු නිළියන්ට අපහසුවක් නොවන සේ නිර්මාණය කර තිබීම.
- ප්‍රවාහනයේ පහසුව.
- ශක්තිමත් බව.

**පසුතල නිර්මාණ**

නාට්‍ය අවස්ථාවන්ට උචිත පරිදි වේදිකාව සකස් කර තිබීම පසුතල නිර්මාණ ලෙස හැඳින්විය හැකිය.

පසුතල නිර්මාණ නිර්මාණ කරණයේ දී නාට්‍ය ඉදිරිපත් කරන රංග ශෛලිය පිළිබඳව සැලකිලිමත් විය යුතුය

බොහෝවිට පසුතල නි විට පසුතල නිර්මාණ භාවිත කරනු ලබන්නේ ලෝක ධර්මී ශෛලිය ට අයත් නාට්‍යයන්හි දී ය.නාට්‍යධර්මී ශෛලියෙන් නාට්‍ය වල දී පසුතලය ඉදිරිපත් කරනු ලබන්නේ,

- දෙබස් මගින්
- ගීත මගින්
- වේදිකාවේ වටයක් යෑමෙන් ය

පසුතල නිර්මාණ සංකේතාත්මකව මිනිස් සිරුර උපයෝගී කරගනිමින් ආලෝක උපක්‍රම යොදාගනි ගනිමින් හෝ විචිත්‍ර වස්ත්‍ර යොදා ගැනීම වැනි ක්‍රමවේදයන් භාවිත කරමින් ද වේදිකා නාට්‍ය සඳහා පසුතල නිර්මාණ කළ හැකි ය.

පසුතල නිර්මාණ මගින් සිදුවිය යුත්තේ නළුවා හා රූපණ කාර්ය ඉස්මතු කර දැක්වීමයි. එහි භාවිත වර්ණ, හැඩ තල ආදී නළුවා යටපත් වීම හෝ රූපණ කාර්යය ඉක්මවා පසුතල නිර්මාණ කෙරෙහි ප්‍රේක්ෂක අවධානය යොමු වීම සිදු නොවීමට වග බලා ගත යුතුය.මේ අය පසුතල නිර්මාණයේ දී විශේෂයෙන්ම විශේෂයෙන්ම සැලකිලිමත් විය යුතු කරුණක් ලෙස පෙන්වා පෙන්වා දිය හැකිය.

මීට අමතර ව පසුතල නිර්මාණ කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු.

- පහසුවෙන් හැසිරවිය හැකි වීම.
- පහසුවෙන් ගබඩා කළ හැකි වීම.
- පහසුවෙන් ප්‍රවාහනය කළ හැකි වීම.
- අඩු වියදමකින් උපරිම ප්‍රයෝජන ගත හැකි පරිදි පසුතල නිර්මාණය කිරීම.
- ශක්තිමත් ලෙස නිර්මාණය කිරීම.

අංගරචනය

නයිල් වගේ මුහුණ ප්‍රධාන කොටගෙන සිරුරෙහි සිදු කරනු ලබන වෙනස් කිරීම අංග රචනය ලෙස හැඳින්වේ.

අංග රචනය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට වර්ග කර දක්වයි.

1. සරල අංග රචනය
2. චරිතාංග අංග රචනය

නාට්‍යයක් සඳහා අංග රචනය ආකාර කීපයකින් වැදගත් වෙයි.

- ප්‍රේක්ෂකයාට චරිත හඳුනා ගැනීමට උපකාරී වීම.
- චරිත පිළිබඳව නළුවා තුළත් ප්‍රේක්ෂකයා තුළත් තුළත් විශ්වසනීයත්වයක් ගොඩනැගීමට හැකි වීම.
- නළුවා හට සමාරෝපය සඳහා සහය වීම.
- ආලෝකකරණ තත කරන තත්ත්වයන් යටතේ යටපත් විය හැකියි මුහුණේ හැඩතල ඉරියව් හා ත්‍රිමාණ ලක්ෂණ මතු කර දැක්වීම.

අංග රචනා ද්‍රව්‍ය කිහිපයක්.

1. පෑන් කේක්
2. lining colours
3. ක්‍රේප් හෙයාර්
4. ටූත් එනමල්
5. ලිප්ස්ටික්
6. කාජල්
7. ස්ප්‍රිට් ගම්

අංගරචනා උපකරණ

1. ස්පොන්ච්
2. පින්සල්
3. කතුරු

අංග රචනා කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු.

සමට අහිතකර නොවන ද්‍රව්‍යයක් තෝරා ගැනීම.

1. නළුවාගේ මුහුණේ සියුම් අංගයන්ට හානියක් නොවන ලෙස අංග රචනය සිදු කිරීම.
2. වර්ණ සංයෝජනය පිළිබඳ පිළිබඳ සැලකිලිමත් වීම.
3. නාට්‍ය ශෛලිය පිළිබඳව අවබෝධයෙන් යුතුව කටයුතු කිරීම.
4. නාට්‍ය අයත් කාලය, දේශීය, යුගය පිළිබඳව සැලකිලිමත් වීම.
5. නළුවාගේ ශරීර වර්ණය පිළිබඳව සැලකිලිමත් වීම.

වේෂභූෂණ

නාට්‍යයක චරිත සඳහා නිර්මාණය කරන ලබන ඇඳුම්, පැළඳුම්, ආභරණ ආදිය වේෂභූෂණ ලෙස හඳුන්වයි. මෙම වේෂභූෂණ නළුවාගේ බාහිර සමාරෝපය ටත් අභ්‍යන්තර සමාරෝපයටත් ඉතා වැදගත් ආනුෂාංගික අංගයකි.ප්‍රේක්ෂකයන් හට නාට්‍යයක චරිත හඳුනා ගැනීමටත්, රසවින්දනය හා විශ්වාසනීයත්වයක් ගොඩනැඟීමටත් වේෂභූෂණ වැදගත් වේ.

වේශභූෂණ නිර්මාණයේදී සැලකිලිමත් විය යුතු කරුණු

- නාට්‍ය ඉදිරිපත් කරන රංග ශෛලිය පිළිබඳ ව.
- පිටපතෙහි සඳහන් කාලය දේශය යුගය පිළිබඳව
- නළු නිළියන්ට පහසුවෙන් දරා සිටිය හැකි ලෙස නිර්මාණය කිරීම
- නළු නිළියන් ට තම රංගනයට අපහසුවක් නොවන ලෙස නිර්මාණය කිරීම.
- පහසුවෙන් ඇඟ ලීමට සහ ගැලවීමට හැකි ලෙස නිර්මාණය කිරීම.
- වර්ණ සංයෝජනය පිළිබඳව සැලකිලිමත් වීම.

ඉහත සඳහන් ආනුෂාංගික කලාවන්ට අමතරව සංගීතය සහ නර්තනය ද නාට්‍යයක් සඳහා යොදා ගනු ලබන තවත් ආනුෂාංගික අංගයන් ලෙස පෙන්වා දිය හැකිය.නාට්‍යයට අවශ්‍ය සංගීතය සහ රංග වින්‍යාසයන් නිර්මාණය කර ගැනීමට මෙම කලාවන් දෙකෙහි සහයෝගය ඉතා වැදගත් වේ.

**4.මෙම සතියට නියමිත පාඩම මඟින් ආවරණය විය යුතු ඉගෙනුම් ඵල:**

- අනුෂාංගික අංග යනු කුමක්දැයි හඳුනා ගැනීම.
- ලෝකධර්මී හා නාට්‍යධර්මී නාට්‍ය වල අනුෂාංගික අංග සුසංයෝග කල යුතු ආකාරය හඳුනා ගැනීම.
- අනුෂාංගික අංග සුසංයෝග කිරීමේදී අවධානය යොමු කල යුතු කරුණු හඳුනා ගැනීම .
- නාට්‍ය පෙළට අනුව අනුෂාංගික අංග නිර්මාණය කිරීමට යොමු වීම.

**5.ඇගයීම /තක්සේරකරණ ක්‍රමවේදය හා ආකෘති:**

1. ඔබ නැරඹූ නාට්‍යයක දක්නට ලැබුණු ආනුශාංගික අංග හතරක් නම් කරන්න.
2. එම ආනුෂංගික ආනුශංෂංගික කලාවන් අතරින් දෙකක් පැහැදිලි කරන්න.
3. ඔබ පැහැදිලි කළ ආනුශංගික කලාවන් 2 නිර්මාණය කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු ලියා දක්වන්න.
4. ඔබ නැරඹූ නාට්‍යයෙහි ඔබ සිත්ගත් චරිතය සඳහා සුදුසු රංග වස්ත්‍රයක් නිර්මාණය කරන්න.

**සැකසුම :- S.S.C ජයසූරිය**

**ර/නිවි/සිංහලගොඩ විද්‍යාලය**